# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதான செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
Chief Secretary's Office – North Western Province

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල - மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் - Provincial Council Office Complex, Kurunegala.

මූල්‍ය කළමනාකරණ අංශය
நிதி முகாமைத்துவ பிரிவு
Financial Management Division


| | | |
|---|---|---|
| මගේ අංකය / எமது இலக்கம் / My No — NWP/CS/F/Bud/2023 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No — | දිනය / திகதி / Date — 2022.12. 30 |

**පළාත් භාණ්ඩාගාර (අයවැය) චක්‍රලේඛ 07/2022**

වයඹ පළාතේ සියළුම ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත.

## 2023 වාර්ෂික ඇස්තමේන්තු - ප්‍රාදේශීය පරිපාලනය ප්‍රතිපාදන වෙන්කිරීම

2023 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි පළාත් සභා අරමුදලින් දැරිය යුතු පුනරාවර්තන වියදම් වෙනුවෙන් එන්.ඩබ්.පී. 260 - ප්‍රධාන ලේකම් වැය ශීර්ෂය යටතේ ඔබගේ ඉල්ලීම් ලැබීමෙන් පසුව ප්‍රතිපාදන වෙන් කර දීමට කටයුතු කරනු ලැබේ.

02. වයඹ පළාත් සභා ගිණුම් ක්‍රියාවලිය මෙහෙයවීමේදී පළාත් මූල්‍ය රීති, ආයතන සංග්‍රහයේ විධිවිධාන පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ හා වෙනත් අදාළ උපදෙස් වලට අනුකූලව කටයුතු කළයුතු බවට උපදෙස් දෙමි.

03. 2023 වර්ෂයේ වාර්ෂික මුදල් ප්‍රකාශයේ 260 - ප්‍රධාන ලේකම් වැය ශීර්ෂයේ, 03 - පළාත් පරිපාලනය වැඩ සටහනේ, 03 - ප්‍රාදේශීය පරිපාලනය ව්‍යාපෘතිය යටතේ අනුමත වී ඇති සීමිත ප්‍රතිපාදන වලින් ඔබ වෙත මෙම ප්‍රතිපාදන වෙන්කර දෙනු ලබන හෙයින්, දැඩි අරපිරිමැස්මෙන් හා වියදම් පාලනය කර ගනිමින් වැය දැරීමට කටයුතු කළ යුතු බව දන්වමි. පළාත් සභාව වෙත පැවරී ඇති **ප්‍රධාන ලේකම් වැය ශීර්ෂයට අදාල විෂයයන් සඳහා විනා, වෙනත් ඒට පරිබාහිර කාර්යයන් කිසිවක් සඳහා වූ වියදම් ප්‍රධාන ලේකම් වැය ශීර්ෂයෙන් නොදැරිය යුතු බවද අවධාරණය කරමි.**

04. ඔබ කාර්යාලය සඳහා වෙන්කර දෙනු ලබන පුනරාවර්තන ප්‍රතිපාදන සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් පහත සඳහන් කරමි.

04.1 වැටුප් හා වේතන : 260- 03 - 03 - 1001

ඔබ කාර්යාලයේ සේවය කරන වයඹ ප්‍රධාන ලේකම් විසින් ඔබ කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති සංවර්ධන නිළධාරී (සැළසුම්) සහ සංවර්ධන නිළධාරී (මූල්‍ය) යන නිළධාරීන්ගේ වැටුප් සඳහා මෙම වැය විෂයය යටතේ ඔබ වෙත ප්‍රතිපාදන වෙන් කර දෙනු ලැබේ. ඒ සඳහා ඔබ කාර්යාලයට 2023 වර්ෂය සඳහා අනුයුක්තව සිටින එම නිළධාරීන් සංඛ්‍යාව සහ අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය 2023.01.12 දිනට පෙර මා වෙත දන්වා එවීමට කටයුතු කල යුතුවේ.

(මේ සඳහා ඇමුණුම 01 භාවිතා කරන්න.)




ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary — Tel : 037-2228019, Fax : 037-2223777, e-mail : chiefsecretary@nw.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය / பிரதான செயலாளர் அலுவலகம் / Chief Secretary's Office — Tel : 037-2231769-72, Fax : 037-2222234, e-mai : csnwp@sltnet.lk, Web site : www.cs.nw.gov.lk

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) / பிரதி பிரதான செயலாளர் (நிதி முகாமைத்துவம்) / Deputy Chief Secretary (Financial Managment) — Tel : 037-2223731, Fax : 037-2228128, e-mail : dcsfnnwpc@yahoo.com